# Living the Lotus

8
2022

VOL. 203

Buddhism in Everyday Life




## *Founder's Reflections*

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍ර ධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.


Living the Lotus
Vol. 203 (August 2022)

Senior Editor: Keiichi Akagawa
Editor: Jigjidkhorloo Gereltuya
Copy Editors: Ruklanthi Palipana, Sahan Chamara , Rajitha Madurangha

*Living the Lotus* is published monthly by Rissho Kosei-kai International, Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp


## හදවත සහ මනස සංවර්ධනය

මත්සුශිතාකෝනෝ සාන්, කුමන අයෙකුගේ කතාවක් වුවත් 'ඇත්තටම එහෙමනේද' යැයි කියමින් කතාවට සාවදානව සවන්දෙන අයෙකි. වයස්ගත වීමත් සමග ලබන ලද අත්දැකීම් තුලින් හදවතේ නම්‍යශීලිත්වය සහ මෘදු බව නිසා එවන් පුද්ගලයන් අන් අයගේ ආදරය ලබන පුදගලයන් බවට පත්වේ.

බුදුන් වහන්සේ පිඩුසිඟා වඩින අවස්ථාවක එක්තරා බ්‍රාහ්මණයෙකුගේ නිවස ඉදිරියේ වැඩ සිටින විට, එම බ්‍රාහ්මණකුලයේ ප්‍රධානියා 'මම කුඹුරු වැඩකර බීජ වපුරා අස්වනු නෙලා ගෙන මහන්සිවී ආහාර රැස්කරගන්නවා. ඔබත් කුඹුරු වැඩ කර බීජ වපුරා මහන්සිවී ආහාර සපායා ගත්තානම් හොඳයි' යැයි පවසා සිටියා. එවිට බුදුන් වහන්සේ 'මමත් කුඹුරු වපුරමින් ආහාර සපයා ගනිමින් සිටිනවා' යැයි පිළිතුරු ලබා දුන්නා. එවිට බ්‍රාහ්මණයා 'ඔබ කුඹුරු වපුරමින් ආහාර සපයා ගන්නවා අපි කිසිදිනක දැක නැහැ' යැයි පැවසුවා. එවිට බුදුන් වහන්සේ, 'මම සියළුසත්වයන්ගේ හදවත සහ මනස සංවර්ධනය උදෙසා, සත්‍යය නැමැති බීජය වපුරමින් සිටී' යැයි පිළිතුරු ලබා දුන්නා.

අපි වැදගත්කොට සැළකිය යුතු කාරනය වන්නේ, සෑම විටම අපේ හදවත සහ මනස සංවර්ධනය උදෙසා නොකඩවා කටයුතු කලයුතු බවයි. එසේ කටයුතු කරන විට, නිරන්තරයෙන්ම මෘදු මොලොක් හදවතින් යුතුව අන් අයව පිළිගැනීමට හැකිවේ. අන් අය පවසනදේට අවංකව සාවදානව සවන් දීමට හැකියාව ලැබේ. එවිට ස්භාවිකවම පුද්ගලයන් අප දෙසට ආකර්ෂනයවේ.

අන් අයට හොඳින් සවන්දීම පුද්ගල සබඳතාවයන් යහපත් ලෙස ගොඩනාගා ගැනීමට හේතු සාධක වන අතර, විශේෂයෙන්ම ජීවිතයේ මැදි වයස ගතකරන පුද්ගලයන්ට හදවතේ මෘදු මොලොක් බව වටිනා සම්පතකි.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 230-231

# සත්‍ය වශයෙන්ම තමන්ව ජීවත් කරවන - වීර්යය ②

**නිචිකෝ නිවානෝ තුමා**
**ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය**



## අපි සෑම කෙනෙක්ම ලෝක ගෝලයේ මතුපිට එක් තිතකි

'මෙහි එක්තරා ගෝලයක් ඇතැයි සිතමු. එම ගෝලය මත තිතක් තබමු. අපි එම ගෝලය මත තැබූ තිත මෙනි.' මෙය සෙන් යතිවරයෙකු මෙන්ම කඩු ශිල්පයේ ප්‍රවීණයෙකුද වන ඕමොරි

සෝගෙන්ගේ කියමනකි. එම කියමන එක් ගෝලයක අපි එම ගෝලයේ කොතනක තිතක් තැබුවද, එම තිත තැබූ ස්ථානය ගෝලයේ කේන්ද්‍රයවේ. තිත් කෝටියක් ගැසුවද කේන්ද්‍රයක් නොවන එකදු තිතක්වත් නොමැත. කෙසේ නමුත් 'ගෝලය එකක් පමණි' යැයි එතුමා පවසයි. එය පුදුම සහගත දෙයක් යැයි දැනුනද එතුලින් අපිට ලෝක සත්‍යය මනාව පිළිබිඹු කරදෙයි.

මෙතනදී සඳහන් කරන 'ගෝලය' පෘතුවිය යැයි සිතන්නේ නම් එය වඩාත් තේරුම් ගැනීමට පහසු යැයි සිතමි. පෘතුවි පෘෂ්ඨය මත සිටින අපි එකිනෙකා පෘතුවි කේන්ද්‍රයේ සිටින නිරපෙක්ෂ පැවැත්ම සහිත ජීවීන්ය. එම නිසා තමාත්, සූර්‍යයා, ජලය, වාතය යන සියළුදේම ඇතුළුව අන් සියළුදෙනාගේම පිහිටෙන් ජීවත් වන නිසා, ඒ ආකාරයට බැලූ කල මේ සෑම දෙයකම සමස්තය එකක් යැයි කිවහැකිය.

මෙම අර්ථකතනය, විශ්වය පුරා පැතිරෙමින්, එසේම සමාජයේ සහ කුඩාම ඒකකය වන පවුලටද එක ලෙස බලපායි. පවුල තුල තාත්තා, ගෘහ මූලිකයා වී දරුවන් එහි අවසානය නොවිය යුතුයි. සෑම කෙනෙක්ම අතිවිශිෂ්ඨ ජීවයක් ඇති අයවේ. ඒ සෑම පුද්ගලයෙකුම පවුල සහ සමාජය තුල සිටින මිනිසුන් සමග තිබෙන අන්තර්සබඳතාවය නිසා ජීවත්වේ.

බුදුන් වහන්සේ දේශණා කල පාඨයක් නම්, 'අග්ගෝහමස්මිං ලෝකස්ස ජෙට්ඨෝ හමස්මිං ලෝකස්ස' යන්නයි. මෙහි සරළ අර්ථය නම්, විශාල සමස්ථයක් තුල එකට ජීවත් වන නිරපේක්ෂ එක් පුද්ගලයෙකු යන්නයි. එනම් 'තමා තමාටම ගෞරව කිරීම' යන අර්ථයයි. අනෙක් අතට මේ විශ්වය තුල සිටින එක් ජීවියෙක් ලෙස, පෘතුවියේ එක් පුද්ගලයෙකු ලෙස, සෑම කෙනෙක්ම 'එකම ජීවයක් තුල සහෝදර සහෝදරියන් ලෙස එකට ජීවත් වීම' බුදු දහමේ උගන්වන සැබෑවූ යථාර්තයයි.

සය පාරමිතා වන්හි වීර්යය යනු, මේ ආකාරයට අපිට ජීවත් වීමට ලැබීම පිළිබඳව කෘතවේදීව, 'අන් අයට ස්තුතිවන්ත වීමේ, පිහිටවීමේ හදවත අමතක නොකිරීමේ පුරුදු පුහුණුවයි'. එම ප්‍රායෝගික පුහුණුව තුලින් ඔබ ඔබටම ගරු කරන ආදරය කරන කෙනෙකු බවට පත් වනවා සේම, මිනිසුන්ගේ දුක් කම්කටොළු ඔවුන් සමග බෙදාහදා ගනිමින්. දුකට පත්ව සිටින අයට අතහිත දෙන පුද්ගලයෙකු

## ආශිර්වාදයේ පිහිට ලැබෙන තැන් සොයා ගනිමු

ගිය මාසයේ මෙම සඟරාව තුලින් ‘අන් අය වෙනුවෙන් යහපත්දේ කිරීම’ ‘ධර්ම මාර්ගයේ ගමන් කරන්නෙකු ලෙස සාමන්‍යය දේ සාමාන්‍ය ලෙස සිදුකිරීම’ වීර්යය වැඩීම යැයි පැවසුවා. කෘතවේදීත්වය මූලික කරගත් එවැනි පුරුදු පුහුණු නොකඩවා කරගෙන යාමට, එදිනෙද කටයුතු වලට ‘ස්තූතිවන්තවීම’ වැදගත්වේ.

බොහෝ පුද්ගලයන් තමන් සර්වසම්පූර්ණ පුද්ගලයෙකු යැයි නොසිතනවා යැයි මම සිතමි. එම හේතුව නිසාම ‘වීර්යය වඩමින්’ දේවල් ඉගෙන ගනිමින් කටයුතු කරන නමුත්, වීර්යය වැඩීමේ වැදගත්කම අවබෝධ වනුයේ බුදු දහම ඉගෙනීමෙන් පසුවයි. යථාර්තය නම්, පවුලේ සාමාජිකයන්, ඥතීන්, හිත මිතුරන්, ධර්ම සාමාජිකයන්ගේ පිහිටෙන් අපිට බුදු දහම ඉගෙනීමට හැකිවී තිබෙන නිසා, ප්‍රථමයෙන්ම අප අවට සිටින සෑම සියළු දෙනාටම කෘතවේදීව, ධර්ම මිතුරන් සමඟ වෙහෙස මහන්සිව  එකමුතුව කටයුතු කරමින් ‘ස්තූතුවන්ත විය හැකි’ කුඩා කාරණාවක් හෝ සොයාගෙන, එම ස්තූතිවන්ත හැඟීම ක්‍රියාවට නැංවිය යුතුයි.

එසේම ‘ස්තූතිවන්ත විය හැකිදේ’ අවබෝධ කරගැනීම ගැන පවසන විට අප සංවිධානයේ සිදුකරන සෙප්පෝ ඉදිරිපත් කිරීම ඉතාම වටිනා දෙයකි. දුකින් මිදීමට ඕනා යැයි ප්‍රාර්ථනා කරමින් සිටින පුද්ගලයන්, බුදුන් වහන්සේගේ ධර්මය තුලින්, දුකට හේතුව, තමන් සිතන පතන ආකාරය, සෑම දෙයක් දෙසම තමා බලන ආකාරය වැරදියි යැයි අවබෝධ කරගෙන තම ජීවිතය යහපත් ලෙස වෙනස් කර ගත් එවැනි අත්දැකීම් සගවන්නේ නැතිව ඉදිරිපත් කිරීමයි. එය එක් අතකට අන් අයගේ පිහිටෙන් තමන්ට ජීවත් වීමට හැකි වී තිබෙන බව අමතක කර සිටි පුද්ගලයෙක්, ‘සෑම සියළු දෙයක්ම ස්තූතිවන්ත විය යුතු දේවල් නේද’ යැයි වටහාගෙන ස්තූතිවන්තව ජීවිතය ගත කිරීමට වෙනස් වීම, බුදු දහමට අනුකූලවූ ජීවත්වීම වේ.

ධර්මයේ අලෝකයට අනුකූලව තමන් මෙතෙක් කටයුතු කල ආකාරය, තමන්ගේ හදවතේ ස්භාවය ගැන ආපසු විපරම් කර බැලු විට, අපට ජීවිතයේ ප්‍රථම වතාවට ‘විශාල පිරිසකගේ ආශිර්වාදයෙන් පිහිට’ මැද අපි ජීවත් වන ආකාරය අවබෝධ වී, මම ජීවත්ව සිටින්නේ සෑම කෙනෙකුගේම පිහිටෙන් බව සනාථ වේ. එලෙස බැලූ විට, සෙප්පෝව ඉදිරිපත් කිරීම තමාගේ ජීවිතය යහපත් කරලීමට වැදගත්ම විර්යය වැඩීමක් බවයි. එවන්, සතුට ගෙනදිය හැකි සෙප්පෝ ඉදිරිපත් කිරීමෙන් එය අසන්නන්ගෙ සිත් වලටද ඉමහත් වු සතුටක් ගෙනදෙයි. නික්යෝ නිවානෝ තුමා පවසන ආකාරයට එමගින් තමන් තුල ඇතිවන්නාවු ධර්මයේ සතුට තමන්ගේ ධර්ම යහළුවන්ටද  බෙද දිය හැකි, කරුණාව, දයාව කැටි වු පරාර්ථකාමී ධර්ම පුහුණුවක්ද වේ.

සෑම සියළු දෙනාටම සිත සැනසිල්ලෙන් නිදගත හැකි ලෝකයක් බවට මේ ලෝකය පත් වේවායි! ප්‍රාර්ථනා කරමින්, අපි සියළුදෙනා ඒ වෙනුවෙන් ඇපකැපවී වීර්යය වඩමු.

From *Kosei*, August 2022.

# ජීවිතය තුල අපතේ යන කිසිවක් නොමැත

ශ්‍රී ලංකා ධර්ම ශාඛාවේ කියෝකයිචෝ

සුසුකි හිරොනොබු

මෙම සෙප්පොව 2022 අවුරුද්දේ 06 වන මස 18 වන දින පවැත් වූ දකුණු ආසියා ධර්ම නායක සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරන ලද්දකි.

හැමෝටම සුභ දවසක් වේවා.මම ශ්‍රී ලංකා ධර්ම ශාඛාවේ ශාඛා ප්‍රධානී සුසුකි හිරොනොබු. මම ශ්‍රී ලංකාවේ රාජකාරී ආරම්භ කර දැනට වසර 4 ක් වනවා.

මම සුසුකි පවුලේ සහෝදර සහෝදරියන් හතර දෙනෙකුගේ වැඩිමහල් සහෝදරයා ලෙස උපත ලැබුවා. ආච්චී සීයාගේ කාලයේ සිටම දෙමාපියනුත් මමත් කෝසෙයිකායි සංවිධානයේ ක්‍රියාකාරී සමාජිකයින් වන බැවින් මමත් සහෝදරියනුත් කෝසෙයිකායි තුන්වන පරම්පරාවයි. දෙමාපියන් සෑම දිනකම උදේ සවස සූත්‍ර සජ්ජායනය කල බැවින් මට එය නැලවිළි ගීයක් වුනා. මගේ මව ධර්ම ශඛාවේදී ඉගෙනගත් දේ අපිට හොදින් කියා දුන්නා. අදටත් අම්මා පැවසූ වචන මගේ හිතේ රැඳී තිබෙනවා. කනිෂ්ඨ පාසල් අවධියේදී, ගිම්හානයේ එක් දිනක උදෑසන, උද්‍යානයේ තිබෙන පොකුණේ නෙළුම් මල් පිපී තිබෙනවා දුටු අම්මා, පොකුණේ තිබෙන මල් පිපී තිබෙන්නේ කොහෙන්ද කියා දන්නවද කියා විමසූවා. නෙළුම් මල් පිපෙන්නෙ මඩෙන්. ඔයාල උස් මහත් වෙනකොට මේ ලෝකය තවත් අවුල් වී තිබෙන්නට පුලුවන් නමුත් ඔයාල තාම පොඩි ළමයි නිසා මල් වගේ ජීවිතය ලස්සන කර ගන්න, ලෙස පුංචි අපට තේරෙන විදියට කියා දුන්නා. අද ඒ ගැන සිතන විට 'සමාජයට ලෝකයට වැඩදායී පුද්ගලයෙකු ලෙස' බෝධිසත්ව හදවත වර්ධන කර ගන්න ඉගැන්වූවා කියා සිතෙනවා. එම වදන් මගේ ධර්ම පුහුණුවේ අරම්භක ලක්ෂය වූවා.

තාත්තට ලැබෙන ආදායමෙන් පමණක් හය දෙනෙකුගෙන් යුත් පවුල ජීවත් කරලීමට හැකිවුනේ බුදුන් වහන්සේගේ ආශිර්වාදය නිසා යැයි අම්මා නිතරම පැවසූවා. අපි බුදු දහම අදහමින් සිටියත් සැබෑවටම අපේ පවුල ධනවත් පවුලක් නොවේ. මගේ තාත්තා ස්වයං රැකියාවක් ලෙස නිවසට යාබද නූල් සකසන ස්ථානයක වැඩ කරමින් කෙසේ හෝ අපව ජීවත් කරවූවා.

එක් දිනක් කනිෂ්ඨ පාසලට යෙන් 2000 ක මුදලක් රැගෙන යාමට නියමිතව තිබුණා. මුදල් රැගෙන යාමට නියමිත දිනට පෙර දින සවස පාසලට රැගෙන යාමට මුදල් නොමැතිව පවුල තුල ගෝෂාකාරීව ගෙදර තිබෙන කාසි එකිනෙක එකතු කර නියමිත මුදල එකතු කරගෙන පසු දින පාසලට රැගෙන ගියා. පාසලේ මුදල් එකතු කල පුද්ගලයා මට නිතරම විහිළු කරන සිසුවෙක් වුනා. මම අකමැත්තෙන් ඔහුට සල්ලි දුන් විට ඔහු කාසි ටික මල්ලෙන් එළියට අරගෙන මේසය මත දමා මළවදයක් යැයි කියමින් කාසි එකිනෙක ගනන් කරන්න පටන් ගත්තා. මමත් මුදල් ගනන් කරනකල් එතනම සිටියා. එත් එයා එකපාරටම උස් හඬින් පන්තියටම ඇහෙන්න සුසුකි යෙන් 100 ක් මිදි මෙතන යෙන් 1900 යි තියෙන්නේ කියා කෑගැසුවා. ඒ වෙලාවේ මගේ මුහුණ රතුවී ගිනි පිටවනවා මෙන් ලොකු ලැජ්ජාවක් දැනුණා. ඇත්තටම ඔහු යෙන් 100 ක් සගවාගෙන සිටියා. ඇයි මේවගේ අප්‍රසන්න වැඩ කරන්නේ යැයි මගේ හදවත කණගාටුවෙන් පිරී ගියා. මගේ දුකෙහි පීඩාවේ තරහව එල්ල වූයේ තාත්තා දෙසටයි. තාත්තා පොඩි ස්වයං රැකියාවක් කරන නිසා පවුලම දුප්පත්, ඇයි අපි මේ තරම් දුක් විදින්න ඕන යැයි තාත්තා ගැන දැඩි තරහවක් සිතෙහි හටගත්තා. එසේම අනෙක් අතට තාත්තා උදේපාන්දර සිටම රාත්‍රිය වන තෙක්ම දහදිය වගුරවමින් මහන්සි වන ආකාරය මතකයට අවා. තාත්තා කතා නොකලත් අපට ආදර්ශමවත්ව එය පෙන්වූවා යැයි සිතනවා. තාත්තා කොහොමහරි මහන්සිවී වැඩ වැඩි රැකියාවක් කරන්න යැයි අපට ඉගැන්වූවා යැයි මා සිතනවා. තාත්තා ගැන සිතන විට සිතෙහි ඇතිවන කණගාටුවට මා කාටත් නොපෙනෙන ලෙස ඇඬුවා.

මේ කාලයේ පවුලේ සෑම දෙනාගේම පිහිටෙන් විශ්ව



අන්තර්ජාලය ඔස්සේ සෙප්පෝව ඉදිරිපත් කරන සුසුකි කියෝකයිචෝ

විද්‍යාලයෙන් උපාධිය ලබා සමාජයට පැමිණියා. මට මෙ කාලයේදී බුදුන් වහන්සේ, ජීවිතයේ බරපතල කම තේරුම් ගැනීමටත්, කොයි ආකාරයට ජීවත් විය යුතුද යන්න පහදා දීමටත්, අත්දැකීමක් ලබාදුන්නා. මම විවිධ රැකියා සොයමින් අවසානයේදී ඕසකා වල වෙළඳ සමාගමක රැකියාවකට ගියා නමුත්, අවුරුද්දක් දෙකක් යනවිට රැකියාවේ ආර්ථික මට්ටම ටික ටික පිරිහෙන්නට පටන් ගෙන වැඩපලත් වැසී යාවි යැයි සැකයක් මතු වුනා. වෙළඳ සමාගම් වලට ගෙවීම් ප්‍රමාද වීම් සේවකයන්ගේ වැටුප් අඩුවීම් වැනි දේ නිසා අනාගතයේ ජීවත් වන්නේ කොහොමද යැයි සිත කලබලයට පත් වූ දුශ්කර කාලයක් වුනා. රැකියා ස්ථානය හොඳ අතට හැරේවි යැයි සැක සහිත නිසා මම රැකියාව අතහැර මගේ ගම වන හමමත්සු වලට පැමිණියා. පවුල නඩත්තු කිරීම සඳහා හැකි ඉක්මනින් රැකියාවක් කලයුතු නිසා පලතුරු හා එළවලු තොග ව්‍යාපර ස්ථානයක රැකියාවකට ගියා. මට රැකියාවක් ලැබුනත් හදවතේ යම් අපැහැදිලි බවක් තිබුනා. කලින් නිරතව සිටි වෙළඳ ස්ථානයේ සහ දැන් නිරතව සිටින එළවලු පලතුරු වෙලදම උදේ 3.00 සිට පොක්ලිෆ්ට් එකට නැගී එහේ මෙහේ යමින් ගැණුම් කරුවන්ට යටහත් පහත්ව එළවලු පලතුරු විකුණන දහදිය වගුරන රැකියාවක් වුනා. මම රැකියාව පහත් කොට සලකමින්, 'හොඳ රැකියා, නරක රැකියා ලෙස' වර්ග කර සිටියා.

එම නිසා සැම විටම මට තිබුණේ කලකිරුනු හැඟීමක් නිසා රාජකාරී කිරීම අමාරු උනා. මගේ ජීවිතය මේ වගේ තමා යැයි මා ගැන අවතක්සේරු කරමින් සිතට එකගව රැකියාව කල නොහැකි වුවත් කරන්න දෙයක් නොමැති කම නිසා රැකියාව කරනවා යැයි හැඟීමක් සිතෙහි තිබුනා.

ඒ කාලයේ හමමත්සු ධර්මශාඛාවේ පැවැත්වූ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය උගන්වන තරුණ සම්මන්ත්‍රණයකට සහභාගී වන්න යැයි ආරාධනා කලා. ඇත්තටම එයට සහභාගී වීමට මගේ කිසිම උනන්දුවක් තිබුනේ නැහැ. මන්ද තරුණ සම්මන්ත්‍රණ වලදී උදේම නැගිටින්න වෙනවා නිදගද්දි රෑවෙනවා, ඒ නිසා මම යන්නේ නෑ කියා පවසා සිටියා. නමුත් කීපවතාවක්ම කතාකල නිසා ටිකක් ගිහින් බලනවා යන හැඟීමෙන් සම්මන්ත්‍රණයට සහභාගී වූවා. එහිදී සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ 4 වන පරිච්ඡේදය වන විශ්වාසය හා අවබෝධය ගැන ඉගැන්වූවා. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ නව පුළුල් විවරණය පොත (නිර්මාතෘ තුමා, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය අපට තේරුම් ගැනීමට පහසුවන ලෙස ලිහිල්ව රචනා කල ග්‍රන්ථය) කියවමින් යන අතර තුර එක් වදනක් ලග මාගේ දෙනෙත් නතර වුනා. එයනම්, 'තමාව පහත් කොට සිතීම' යන්නයි. තමාව පහත් කර සැලකීම තමා තුල තිබෙන බුද්ධ ශක්තිය පහත් කොට සැලකීමකි. එනම් එය බුදුන් වහන්සේව පහත් කර සිතීමකි. බුදුන් වහන්සේට අපහස කිරීමකි. මෙම පේළි දෙක කියවීමෙන් පමණක් නිර්මාතෘ තුමාගේ වදන් වලට මා කම්පනයට පත් වුනා. මා මාගේ රැකියාව ගැන පහත් ලෙස සිතීම ගැන මටම ලැජ්ජාවක් ඇති වූවා. තමත් තමන්ව පහත් කොට සලකනවා කියන්නේ බුදුන් වහන්සේටත් නිර්මාතෘ තුමාටත් කරන අපහාසයක් නේද මෝඩ දෙයක් නේද යැයි අවබෝද වුනා. ඇත්තටම මෙම සම්මන්ත්‍රණය මා වෙනුවෙන්ම වූ සම්මන්ත්‍රනයක් යැයි සිතීමට, හදවතින්ම ස්තුතිවන්ත වීමට හැකි වුනා.

ඒ වගේම පහුවදා සිට රැකියාව ගැන මගේ සිතේ තිබුන හැඟීම වෙනස් වුනා. හැමොටම කලින් රැකියා ස්ථානය වෙන ගොස් මුලින්ම ගබඩාව විවෘත කර පාරිබෝගිකයන්ගේ ඇණවුම් බාර ගනිමින් අන් සේවකයන් පැමිණීමට පෙර සිටම වැඩ කටයුතු ආරම්භ කලා. මාගේ සැබෑ ජීවන රටාවට දෑස පෑදුනේ ඒ මොහොතේදීය. නිර්මාතෘ තුමාගේ වචන වලින් මට දෑස් විවර කරගන්නට හැකියාව ලැබුනා. එසේ කරන විට රැකියාව කිරීම මට මහත් සතුටක් ගෙන දෙන්නක් බවට පත්වී එය විනෝදයක් වුනා. ටිකෙන් ටික පාරිබෝගික සංඛ්‍යාවද වැඩිවීමට පටන් ගෙන තව මහන්සි වෙන්න ඕන යන හැඟීමට පත් වුනා.

මම මේ රැකියාව හැකි උපරිමයෙන් කරනවා යැයි තීරණය කල විට මගේ ගමේ ධර්ම ශඛාවේ කියෝකයිචෝ සාන්ගේ උදව්වෙන් 2000 අවුරුද්දේ 12 වන මස කෝසෙයි කායි සංවිධානයේ කාර්ය මණ්ඩලයට ඇතුළත් වීමට හැකිවුනා. එහිදී මූලස්ථානයේ තරුණ කණ්ඩායමේ ප්‍රාදේශීය ධර්ම නායක ලෙස වසර 10 ක් සේවය කලා.

2010 අවුරුද්දේ 12 වන මස ඔකිනවා ධර්ම ශාඛාවේ කියෝකයිචෝ ලෙස පත්වීම් ලැබුවා. (ඔකිනවා යනු ජපානයේ දකුනු කෙලවරේ පිහිටා තිබෙන දූපතක්) ඔකිනවා තුල ඈත අතීතයේ සිටම විශ්වාස කල ප්‍රදේශයට ආවේණික වූ ඇදහීම් ක්‍රම ඉතිරිව තිබූ ප්‍රදේශයක් වුනා. කෙස්වෙතත් පත්වීම් ලබා ගිය පසු පුදුමයට පත් වූ සිදුවීමක් වුනා.



සාමාජික නිවසක සූත්‍ර සජ්ජායනය කරන අතර තුර

එක් හෝසාවක ඇති වූ සිද්ධියක්, එක් සාමාජිකයෙක් ලෙඩ වී සිටින තම පවුලේ අය ගැන කනස්සල්ලෙන් දුක කියමින් සිටියා. මම එයට සාවදානයෙන් ඇහුම්කන් දුන් අතර මා කිසිවක් කතා කලේ නැති මුත් එම පුද්ගලයා යම් සහනයක් ලබා සිටින බව දුටු අතර විශ්වාසයෙන් යුතුව, 'අද හෝසාවට සහභාගී වුන එක හොදයි ලෙස පවසා සිටියා. සාම්ප්‍රදයික ඇදහීම තුලදීත් දුක පවසා සිටියත් සහනයක් දනුණේ නැහැ අදනම් සිතට සහනයක් දැනෙනවා කියා' සිනහ මුසු මුහුණින් පිටත්ව ගියා. ඒත් සමගම පැරණි ඇදහීම් සමග කෝසෙයිකායි ඉගැන්වීම් සංසංදනය කරන බව හැගීම සිතෙහි නොසන්සුන් බවක් ඇතිකලා.

එලෙස සැකයෙන් සිටින විට, නිචිකෝ නිවානෝ තුමා සමග සාකච්චාවකට අවස්ථාවක් ලැබුනා. එම අවස්ථාවේ මා නිවානෝ තුමාගෙන්, පැරණි සාම්ප්‍රදයික ඇදහීම් තවමත් පවතින ඔකිනවා වල බුද්ධ ප්‍රතිමා තැම්පත් කිරිමට මට මග පෙන්වීමක් ලබා දෙන්න යැයි විමසා සිටියා. එවිට නිවානෝ තුමා, 'කියෝකයිචෝ සාන් බුදුන් වහන්සේට කොපමණ දුරට ගෞරව කරන්න විශ්වාස කරන්න හැකිවුනාද' ලෙස විමසුවා. කියෝකයිචෝ කෙනෙක් ලෙස බුදුන් වහන්සේ උදෙසා තිබිය යුතු ගෞරවය භක්තිය ගැන ඉගෙන ගත්තා.

ඒ වෙලාවේ මට, බුදුන් වහන්සේගේ ආරක්ෂාව තියන නිසා සැනසීමෙන් ඉන්න පුලුවන් කියා, අම්මා උගන්වපු කතාවක් මතක් වුනා.

ඒ කාලයේ අම්මා සහ තාත්තා සවස හෝසා වලට සහ තෙදොරි වලට නිවසින් පිටතට යමින් සිටියා. මමත් මල්ලිලා දෙන්නත් නංගීත්, දෙමාපියන් නැතිව දුකෙන් කනස්සල්ලෙන් සිටියා. මෙලෙස දුකින් සිටින අපගේ මුහුණු දුටු අම්මා අපව බුදු කුටිය වෙතට රැගෙන ගොස් ඔයාල ලගින් බුදුන් වහන්සේ ඉන්නවා ඔයාල තනි වී නහැ ඒ නිසා බය වෙන්න එපා යනුවෙන් පැවසුවා. එම වදන් මට මහත් ආරක්ෂිත බවක් ගෙන දුන් ආකාරය අදටත් මට හොදින් මතකයි.

අම්මාගේ හදවත තුල බුදුන් වහන්සේ කෙරෙහි තිබූ ගෞරවය විශ්වාසය දරුවන් වන අපට විශ්වාසයක් ආරක්ශාවක් ගෙන දුන්නා යැයි මා සිතනවා. නිචිකෝ නිවානෝ තුමාගේ වචන ඒ අතීතය නැවත මතක් කරවූවා. කියෝකයිචෝ ලෙස රාජකාරී කරගෙන යන ගමන් බුදුන් වහන්සේව කොපමණ විශ්වාස කරනවාද, යන්න ජීවිතයේ විවිධ සිදුවීම් වලට හරයක් එක් කල වදනක් ලෙස අදටත් වැදගත් කොට සලකමින් සිටිනවා.

'ජීවිතය තුල වැඩකට නැතැයි කියා බැහැර කල හැකි කිසිවක් නොමැත.' ලෙසින් අප නිර්මාතෘ තුමා අපට උගන්වයි. මෙතෙක් ජීවිතය දෙස ආපසු හැරී බලන විට, ලබපු අත්දැකීම් කිසිවක් බැහැර කල නොහැකි යැයි වැටහේ. ඒ සියල්ල මගේ වර්ධනයට රුකුලක් වෙමින් නෙළුම් මලක් සේ ජීවිතය පුබුදුවා ගැනීමට උපකාර වේ.

මේ වන විට නව කොරෝනා වෛරසය පැතිරීම සහ රුසියා යුක්‍රේන යුද්ධය හේතුවෙන් ලෝකයම ව්‍යාකූලව පවතී. ඒ අතර ශ්‍රී ලංකාවේ උද්ධමනය ඉහළ ගොස් ආර්ථික අර්බුදයක් ඇතිවෙමින් තිබේ. මෙය ධර්ම ප්‍රචාරනයට හොදම කාලයයි. මම දැනට ශ්‍රී ලංකාව තුල සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර ය තුලින් සාමය පිළිබද උගන්වමින් මානව සම්පත් වර්ධනය කිරීමෙහිලා කටයුතු කරමින් සිටිනවා. සැම කෙනෙකුම නෙළුම් මලක් සේ විකසිත කරවීමට කැපවෙමින් සම්බන්ධතාවයන් ශක්තිමත් කරනවා. හැමෝටම බොහොම ස්තූතියි.



පොසොන් පොහොය වැඩසටහන අතර තුර

# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම

## බුදුන් වහන්සේගේ ජීවිතය සහ බෞද්ධ ඉගැන්වීම්

### පළමු ධර්ම දේශනය

තමන් අවබෝධ කරගත් සත්‍ය දේශනා කිරීම සඳහා බුදුන් වහන්ස බරණැසට නුදුරින් පිහිටි මිගදයට වැඩම කලා.

ඒ කලක් එකට ධර්මය පුහුණු වූ මිතුරන් 5 දෙනෙකු සිටි නිසාය. මුලදී පස්දෙනාම බුදුන් වහන්සේව තපස් රැකීමෙන් මිදුණු අයෙකු ලෙස පවසමින් නොසලකා හැරීමට උත්සහ කලා. නමුත්, දිදුලන බුදුන් වහන්සේගේ රුව දුටු ඔවුන් නිරායාසයෙන්ම බුදුන් වහන්සේට හිස නමා ආචාර කර බණ ඇසීමට සූදානම් වූවා. පසුව ඔවුන් බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් බවට පත්වූවා. එකල්හි බුදුන් වහන්ස 'මැදුම් පිලිවෙත', 'චතුරාර්ය සත්‍ය' සහ 'ආර්‍ය අෂ්ටාංගික මාර්ගය' ගැන දේශනා කලා.







ඔබේ දැනුමට

බුදුන් වහන්ස අවබෝධ කරගත් සත්‍ය මුලදී මිනිසුන්ට ඉගැන්වීමට පසුබට වූ නමුත්, අතරමංව සිටින පුද්ගලයින්ට එයින් මුදවා ගතයුතුයි යන කරුණාවන්ත හදවතින් පැවසූවා. එයට පිංසිදු වන්නට අද අපත් ඒ සත්‍ය ඉගෙන ගන්නවා.

※කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.





## ධර්ම ව්‍යාප්තිය




බුදුන් වහන්ස බුද්ධත්වයට පත්වී අපවත් වන තෙක් පුරා වසර 45 ක් ප්‍රධාන වශයෙන් ඉන්දියාවේ ඊසාන දිග ප්‍රදේශයන්හි පා ගමනින් ධර්මය දේශනා කලා. එම ස්ථාන පූජනීය ස්ථාන ලෙස වර්ථමානයේ ඉතිරිව පවතී.

බුදුන් වහන්ස උපන් ලුම්බිණිය, බුද්ධත්වයට පත් බුද්ධගයාව, ප්‍රථම ධර්ම දේශනය සිදු කල බරණැස මිගදය සහ පිරිනිවන් පෑ කුෂිනගර් ඒ අතර වේ.

මීට අමතරව ගිජ්ජකූට පර්වතය සහ කුසිනාරාමය හැදින්වේ.

**ඔබේ දැනුමට**

කුසිනාරාමය බුදුන් වහන්සේට තම ශ්‍රාවකයන්ට ධර්මය කියා දීම සඳහා හොඳ ආරාමයක් වුවා. ඉන්දියාවේ වසන්ත සමයේ සිට ග්‍රීෂ්මය දක්වා මාස තුනක කාලයක් වැසි සමය වන බැවින් ධර්ම පුහුණුවේ යෙදෙන භික්ෂූන් වහන්සේලා එළියට වැඩම නොකොට එම මාස තුනක කාලය ආරාමය තුලම රැඳී සිට ධර්ම පුහුණුවේ යෙදුනා.

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: lotusbuddhist@gmail.com
URL: https://sf-buddhism.org/

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Rissho Kosei-kai International**

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**在家佛教韓国立正佼成会　Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會　Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會　Rissho Kosei-kai of Tainan**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rampur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　FAX: 66-2-716-8218　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**